# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/19 – 2018 ඔක්තෝබර් 02 වැනි අඟහරුවාදා – 2018.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2018 අංක 224 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* එල්ඩී/05/2004/වීර්පී/58.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* ආර්පීඩීඑස්/ එල්එන්ඩී/09/ඒසීකිව්/ 17(වීර්).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා – ප්‍රාදේශීය ලේකම්, රත්නපුර.

2. ඉඩමේ විස්තරය. – සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩපත්තුව සුලු කොට්ඨාසයේ, හිදැල්ලන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 342 හා 2006.09.13 දිනැති අවසන් ගම් පිඹුරේ කැබලි අංක 504 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.4324 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 504 – පාම්ගාඩ්න් වත්ත – ප්‍රමාණය: හෙක්. 1.4324**
උතුරට: කැබලි අංක 136 සහ 231; නැගෙනහිරට: කැබලි අංක 136 සහ 188; දකුණට: කැබලි අංක 188, 187 සහ 136; බටහිරට: කැබලි අංක 136.

10 -746

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 223 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/15/2017/වීර්/353.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* බීයූ/එල්එන්/1/1/27.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා – ප්‍රාදේශීය ලේකම්, බුලත්සිංහල.

2. ඉඩමේ විස්තරය. – බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුලත්සිංහල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/බීයුඑල්/2017/676 හා 2018.05.31 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – මිරිස්හේනවත්ත (හිල්ක්‍රොෆ්ට් කොටස) – ප්‍රමාණය: හෙක්. 1.6187**

උතුරට: හොරණ වැවිලි සමාගම හිමිකම් කියන මිරිස්හේනවත්තේ හිල්ක්‍රොෆ්ට් කොටස; නැගෙනහිරට: හොරණ වැවිලි සමාගම හිමිකම් කියන මිරිස්හේනවත්තේ හිල්ක්‍රොෆ්ට් කොටස සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන මිරිස්හේනවත්තේ හිල්ක්‍රොෆ්ට් කොටස; බටහිරට:හොරණ වැවිලි සමාගම හිමිකම් කියන මිරිස්හේනවත්තේ හිල්ක්‍රොෆ්ට් කොටස.

10 -747

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 222 දරන ආඥාව**

*මගේ යොමු අංකය: 4-3/4/2014/ඩී/328.*
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/ඉඅත්/189.*

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 සැප්තැම්බර් 19 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි – ප්‍රාදේශීය ලේකම්, සීතාවක.

2. ඉඩමේ විස්තරය. – බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 436/ඒ, සුදුවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළුඅග්ගල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එච්එන්ඩබ්ලිව්/2017/149 හා 2018.08.03 වන දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1660 ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 1 – උණපඳුරේ ඔව්ට නොහොත් අට්ටික්කාගහ ඔව්ට නොහොත් උණපඳුරේ ඔව්ට සහ අට්ටික්කාගහඔව්ට – ප්‍රමාණය: හෙක්. 0.1660**

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි තෙලඹුගහවත්තේ කැබැල්ල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: 5 වන සන්නද්ධ බුද්ධි බලකා කඳවුර පිහිටි, හිමිකම් කියන අය සොයාගත නොහැකි මුණමලේවත්ත, කේ. ඒ. අනිල් හිමිකම් කියන ඇගලගේ ඔව්ට නොහොත් පෙරිංගහ ඔව්ට, නස්වාන් හිමිකම් කියන ඇගලගේ ඔව්ට නොහොත් පෙරිංගහ ඔව්ට සහ ඩී. ජී. මේරි ජස්ටින් හිමිකම් කියන ඇගලගේ ඔව්ට සහ මඩවලඔව්ට; දකුණට: කේ. ඒ. අනිල් හිමිකම් කියන ඇගලගේ ඔව්ට නොහොත් පෙරිංගහ ඔව්ට, නස්වාන් හිමිකම් කියන ඇගලගේ ඔව්ට නොහොත් පෙරිංගහ ඔව්ට සහ ඩී. ජී. මේරි ජස්ටින් හිමිකම් කියන ඇගලගේ ඔව්ට සහ මඩවලඔව්ට සහ පාර; බටහිරට: පාර, හිමිකම් කියන අය සොයාගත නොහැකි තෙලඹුගහ වත්තේ කැබැල්ල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

10 -748

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.